# වර්තමාන ආර්ථික පසුබිම හමුවේ කුඩා පරිමාණ කඩ හිමියන් වටා පැවති පාරිභෝගික හැසිරීම වෙනස් වූ ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*එච්.ආර්. මධුරංග [1], ආර්.එම්. දිනෙල්කා හරින්දි රත්නායක [2]*

ඕනෑම සමාජයක මිනිසුන් සිය මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමෙන් පසුව ද්විතීයික තෘතීයික අවශ්‍යතාවයන් සපුරා ගැනීමට කටයුතු කරනු ලබයි. එය ඒබ්‍රහම් මාස්ලෝගෙ අවශ්‍යතා ධූරාවලී න්‍යාය තුළ විද්‍යාමාන වේ. නමුත් ආර්ථික අර්බුදයන් යටතේ මෙම තත්වයන් වෙනස් වේ. ඒ අනුව වර්තමාන ආර්ථික පසුබිම හමුවේ කුඩා පරිමාණ කඩ හිමියන් වටා පැවති පාරිභෝගික හැසිරීම කෙබඳු ද? යන්න අධ්‍යනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව විය. පර්‍යේෂණ ක්‍රමවේදය ලෙස මිශ්‍ර ක්‍රමවේදය භාවිතා කර අතර පර්යේෂණය සඳහා අධ්‍යයන සීමාව ලෙස දකුණු පළාතේ, මාතර කඩවස්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 416-ඝ කොට්ටුව වසම යොදාගත්තේය. එහිදී සරල අහඹු නියැදි ක්‍රමය ඔස්සේ පවුල් 40ක් නියැදිය ලෙස යොදා ගත් අතර, දත්ත රැස් කිරීමේදී ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු සඳහා ප්‍රාථමික හා ද්විතීයික දත්ත භාවිත කෙරුණි. සාහිත්‍යය පසුබිම විමර්ශනය කිරීමේදී න්‍යාය හා පූර්ව අධ්‍යයන කෙරෙහි අවධානය යොමු කරන ලදී. පර්යේෂණය තුළින් අනාවරණය වූ මූලික කාරණය ලෙස ආර්ථික අර්බුදය හමුවේ කුඩා කඩ හිමියන් වටා පැවති පාරිභෝගික හැසිරීම ආර්ථිකමය වශයෙන් හැකිලීමකට පත්ව ඇති බවයි. අර්බුදයේ බලපෑම හමුවේ නියැදියෙහි සියලුම පවුල් ආහාර රටාවේ සිට ද්විතීයික තෘතීයික අවශ්‍යතාවයන් කළමනාකරණය කරන බවත්, සමාජමය වශයෙන් සංස්කෘතිකමය හා සෞඛ්‍යමය වෙනස්කම් ද පෙන්වන බවත් අනාවරණය විය. අවසාන වශයෙන් අපගේ නිගමනය වන්නේ පාරිභෝගිකයින් තම දෛනික ජීවිතය පවත්වාගත නොහැකි තරම් අගාධයට පත්ව ඇති බවත් ඒබ්‍රහම් මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලියේ දෙවන තෙවන අවශ්‍යතාවයන් සංතෘප්ත කර ගැනීම මුළුමනින්ම අත්හිටුවා ඇති බවත් කළමනාකරණ සමාජ වෙනස්කම් හමුවේ පරිභෝගික හැසිරීම වෙනස් කර ඇති බවත්ය.ඒ අනුව මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ ආර්ථික අර්බුදයේ බලපෑම හෙළිදරව් කිරීමෙන්, කුඩා පරිමාණ කඩ හිමියන්ට සහ පාරිභෝගිකයින්ට උපකාරී වන නව සමාජ සහ ආර්ථික සහාය ක්‍රම ප්‍රවර්ධනය කිරීම මගින් පාරිභෝගික හැසිරීමේ වෙනස්කම් සහ අර්බුදය හමුවේ උවමනාවන් සපුරා ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ මෙහිදී නිර්දේශ කෙරේ.

***ප්‍රමුඛ පද:*** ආර්ථික, අර්බුදය, ද්විතීයික, තෘතීයික, පාරිභෝගික

[1] ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. randikamadhuranga42@gmail.com
[2] ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. dinelkaharindi@gmail.com